**හලාවත නගර සභාව - 2020**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

හලාවත නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනවලට අනුව දේපළ පිරියත උපකරණ අයිතමයට අදාලව ගිණුම් අනුව හා පොත්පත් අනුව වටිනාකම, ගිණුම් විෂයයන් දෙකකට අදාලව රු.9,927,421ක් වැඩියෙන් හා වෙනත් ගිණුම් විෂයයන් දෙකකට අදාලව රු.11,550,477ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | ගබඩා තොගය රු.438,431ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු අධි වෙන් කිරීම වූ රු.897,380ක් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | හිඟ වරිපනම් අයකර ගැනීමේදී අය කර තිබුණු රු.514,677ක දඩ මුදල් වරිපනම් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | දඩ මුදල් අයකර වෙනම ගිණුම් ගත කරන බව දන්වා සිටිමි. | දඩ මුදල් සඳහා අයශීර්ෂයක් ඇතිකර ඒවා ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව අයවිය යුතුව තිබුණු රු.399,300ක ප්‍රදර්ශන පුවරු ගාස්තු ආදායම සම්පූර්ණයෙන්ම ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ඉදිරියේදී එම මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. | ප්‍රදර්ශන පුවරු ගාස්තු නිසි පරිදි අයකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හා වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 11කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.72,556,071 ක් හා උප ලේඛන වාර්තා අනුව වටිනාකම රු.52,306,010 ක් වූයෙන් රු.20,250,061 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි | ලේඛන නිවැරදි කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිගුකාලීන කුලී පදනම මත ලබාදී තිබූ කඩ කාමර 27ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කළ වටිනාකමින් රු.4,473,215ක් පළාත් පාලන කොමසාරිස්තුමාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2021 මැයි 20 දිනැති සභා තීරණයක් මඟින් කපා හැර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව කඩකුලී සංශෝධන කටයුතු සිදු කර දුන් පසු අයකර ගැනීමට ක්‍රියාකරන බව දන්වනු කැමැත්තෙමි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් කපාහැරීම් සිදුකල යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව බදුදී තිබූ දේපළ 15කට අදාළව බිල්කළ වටිනාකමින් රු.3,427,199 ක වටිනාකමක් පළාත් පාලන කොමසාරිස්තුමාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2021 ජනවාරි 28 දිනැති අංක 19 දරන මුදල් කමිටු තීරණය මඟින් කපා හැර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කර ඇති බව සඳහන් කරමි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් කපාහැරීම් සිදුකල යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.305,906,922 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විස්තරාත්මක උපලේඛන සහිතව ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | අවසාන ගිණුම් සමඟ අදාළ උපලේඛන ඉදිරිපත් කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,013,571ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,953,270ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට නගර සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයවිය යුතු දේපළවලින් රු.46,907,708ක වරිපනම් බදු මුදලක් අය විය යුතුව පැවති අතර නගර සභා ආඥා පනතේ විධි විධාන අනුව හිඟ වරිපනම් අයකර ගැනීමට අදාළව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. තව ද නැවත තක්සේරුවක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ආ) කුලී** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.34,867,858 ක් වූ අතර එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. සභාව සතු කඩ කාමර 37 ක 2020 දෙසැම්බර් 31 වන විට ගිවිසුම් ගත කාලය ඉක්මවා ගොස් තිබුණද නැවත ගිවිසුම් ගත වීමට කටයුතු කර නොතිබුණි. තවද කඩ කාමර 285 ක් සඳහා තක්සේරු ගත බදු කුලිය සංශෝධනය කර නොතිබූ අතර එම නිසා නගර සභාවට ලබා ගත හැකිව තිබූ විශාල ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව කඩකුලී සංශෝධන කටයුතු සිදු කර දුන් පසු අයකර ගැනීමටද නව බදු ගිවිසුම් අළුත් කිරීමටද ක්‍රියාකරන බව දන්වනු කැමැත්තෙමි. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ඇ) මුද්දර ගාස්තු** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තුව රු.51,819,070ක් වූ අතර එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.52,716,450ක මුදලක් ලැබිය යුතුව ඇත. | යාවත්කාලීනව මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.8,871,877ක් වූ පෙර ගෙවුම් ශේෂ වටිනාකම හා රු.73,940ක් වූ සභාව විසින් කළ තැන්පත් වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තව ද සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,467,040ක් වූ අතර පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුව තිබුණු රු.9,021,520 ක මුදලක් ද ගෙවීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉදිරියට ගෙන එමින් පවතින ශේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.<br>ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට එකතු කල අගය මත බදු ගිණුමෙහි වූ රු.2,882,489 ක හර ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය නිරවුල් කිරීම් සිදු කර නොතිබුණි. | සියළු තොරතුරු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මීගමුවට භාර දී ඇත. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන අවශ්‍ය නිරවුල් කිරීම් කල යුතුවේ. |